# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2302/06 – 2022 ඔක්තෝබර් 17 වැනි සඳුදා – 2022.10.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/50/2011.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2016.03.01 දිනැති හා අංක 1956/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2016.02.24 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බණ්ඩාරවෙල, එරණවෙල, ''සම්පත්'' හි පදිංචි ඩබ්. එම්. ජයසිංහ මයා සහ කොළඹ 05, කිරුල පාර, අංක 200, ප්‍රධාන කාර්යාලය, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.15 වැනි දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

ඩබ්ලිව්. එම්. ජයසිංහ මයා,
''සම්පත්'' එරණවෙල,
බණ්ඩාරවෙල.

පළමු පාර්ශ්වය

*නඩු අංකය:* A3630.
IR/10/50/2011.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
ප්‍රධාන කාර්යාලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

දෙවන පාර්ශ්වය

*අතර ඇති කාර්මික ආරාවුල*

**ප්‍රදානය**

1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තියෙන් කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව අමාත්‍යවරයා විසින් ඉහත සඳහන් පාර්ශවකරුවන් අතර වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2016.02.24 වැනි දින මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස්වරයා විසින් IR/10/50/2011 යටතේ 2016.02.10 වන දින ගොණු කරන ලද ලේඛණය අනුව

ඉහත සඳහන් පාර්ශවකරුවන් අතර ඇති ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ

“ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවයේ යෙදී සිටින ලද ඩබ්ලිව්. එම්. ජයසිංහ මහතා 2008.07.15 වැනි දින සිට ප්‍රාදේශීය ධාවන කළමණාකරු තනතුරට පත් කිරීමේදී හා එසේම 2010.08.21 වැනි දින බලපැවැත්වෙන පරිදි ප්‍රධාන වැටුප් ප්‍රාදේශීය කළමණාකාර ස්ථිර තනතුරට පත් කිරීමේදී ද එම තනතුරුවලට අදාළ වැටුප් හා දීමනා ගෙවීමේදී හා නියමිත ශ්‍රේණියන්හි පිහිටු වීමේදී යම් අගතියක් සිදු වී ඇත්ද එසේ සිදු වී ඇත්නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

දෙපාර්ශවය විසින් විස්තර ප්‍රකාශණ ගොණු කිරීමෙන් පසු මෙම කරුණු බේරුම් කිරීමෙන් සමථයක් ඇති කර ගත හැකි ද? යන්න සලකා බැලීම සඳහා 2016.09.20 වැනි දින කැඳවන ලදී. එදින ඉල්ලුම්කරු වෙනුවෙන් නීතිඥ කේ. පී. ගුණසිංහ මහත්මියද දෙවන පාර්ශවය වෙනුවෙන් රජයේ නීතිඥ ෂෙහාන් මුස්තාපා මහතාද පෙනී සිටින ලද අතර දෙවන පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ මහතා කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ ඉල්ලුම්කරු ප්‍රාදේශීය කළමණාකාර තනතුරට පත්කිරීමේදී එම තනතුරුවලට අදාළ වැටුප් හා දීමනා නියමිත ලෙස ගෙව්වාද යන්න සලකා බැලීමේදී ඉල්ලුම්කරුගේ විශ්‍රාම වයස වැදගත් වන බවත්, ඉල්ලුම්කරුගේ විශ්‍රාම වයස සම්බන්ධයෙන් ඉල්ලුම්කරු ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා ඇති නිසා ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ලබා දෙන තෙක් මෙම නඩුව බහා තැබිය යුතු බවයි. එම අවස්ථාවේ ඉල්ලුම්කරු වෙනුවෙන් පෙනී සිටි නිතීඥවරයා ප්‍රකාශ කර සිටියේ බේරුම්කරණයට යොමු වී ඇත්තේ වෙනත් කරුණක් බවත් ඊට ඉල්ලුම්කරුගේ විශ්‍රාම වයස අදාළ නොවන බවත්ය. එම පාර්ශවයේ ස්ථාවරය වූයේ මෙම කරුණ පිළිබඳ විමසීම පවත්වාගෙන යා හැකි බවයි.

2016.11.29 වැනි දින මෙම නඩුව කැඳවූ අවස්ථාවේදී එම කරුණ නැවත ඉස්මතු කළ අතර ඒ පිළිබඳ තීරණයක් ගැනීම සඳහා ලිඛිතව කරුණු ඉදිරිපත් කරන ලෙස දෙපාර්ශවයට දැනුම් දෙන ලදී. දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත සැලකීම් ද සලකා බලා 2017.06.03 වැනි දින මා තීරණය කරන ලද්දේ ඉල්ලුම්කරු ශ්‍රේෂ්ඨාධිකරණයට කර ඇති ඉල්ලීම මෙම ආරවුල විමසීමට බාධාවක් නොවන බවයි. ඒ අනුව ඉල්ලුම්කරු 2017.06.03 වැනි දින මූලික සාක්ෂි ලබා දීම ආරම්භ කරන ලදී. එහිදී ඉල්ලුම්කරු ප්‍රාදේශීය ධාවන කළමණාකරණ තනතුරට පත්කිරීමට අදාළ ලේඛන දෙකක් A 2 හා A 3 ලෙස සළකුණු කර ඉදිරිපත් කරන ලදී. A 2 ලෙස සළකුණු

කර ඉදිරිපත් කරන ලද්දේ ප්‍රාදේශීය ධාවන කළමණාකරණ තනතුර සඳහා පැවැති සම්මුඛ පරීක්ෂණය සඳහා ඉල්ලුම්කරු කැඳවන ලද 2007.03.30 වැනි දින දරන ලිපියයි. A3 ලෙස සළකුණු කර ඉදිරිපත් කරන ලද්දේ ඉල්ලුම්කර ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුරට පත් කිරීමට අදාළ 2008.07.04 දිනැති ලිපියයි.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී A1, A1(a), A1(b), A1(c), A1(d), A1(e), A2 - A20 ට දක්වා වූ ලේඛන සළකුණු කර ඉදිරිපත් කරන ලදී. දෙවන පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලද අතර එම සාක්ෂිය අවසන් වීමෙන් හා ඉල්ලුම්කරු වෙනුවෙන් වෙනත් සාක්ෂි නොකැඳවන බව දන්වා සිටින ලදී. දෙවන පාර්ශවය වෙනුවෙන් ලංකා ගමනා ගමන මණ්ඩලය මූල්‍ය කළමණාකරු සාක්ෂියට කැඳවන ලද අතර ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී.

දෙවන පාර්ශවය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද මූල්‍ය කළමණාකාරවරයා හරස් ප්‍රශ්නවලට භාජනය වෙමින් සිටියදී 2020.10.15 වැනි දින දෙවන පාර්ශවය වෙනුවෙන් තවත් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන ලදී. එම මූලික විරෝධතාවය ඉදිරිපත් කරමින් දෙවන පාර්ශවය ඉල්ලා සිටින ලද්දේ ඉල්ලුම්කරු සේවයෙන් විශ්‍රාම ලබා සිටින අයෙක් නිසා ඔහුගේ ඉල්ලීම සළකා බැලීමට බේරුම්කරණයට අධිකරණ බලයක් නොමැති බවයි. ඒ අනුව දෙවන පාර්ශවය ඉල්ලා සිටියේ ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභාකරන ලෙසය. එම මූලික විරෝධතාවය සම්බන්ධයෙන් ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමට දෙපාර්ශවය අවස්ථාව ලබා දෙන ලදී. දෙපාර්ශවයේ ලිඛිත දේශන සළකා බලා 2020.03.06 වැනි දින එම මූලික විරෝධය ඉවතලමින් මාගේ තීරණය ප්‍රකාශයට පත් කරන ලද අතර ඊට හේතු වශයෙන් මා සඳහන් කරන ලද්දේ දෙපාර්ශවය අතර වූ මෙම කාර්මික ආරවුල ඉල්ලුම්කරු සේවයේ යෙදී සිටියදී ආරම්භ වී තිබීම, ඒ සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාට පැමිණිලි කර තිබීම, අනතුරුව මහනුවර බේරුම්කරණයේදී මෙම ආරවුල විමසීමට ලක්කර තිබීම, අංක A 3630 යටතේ කාර්මික අධිකරණයේදී දීර්ඝ කාලයක් තිස්සේ විමසීමට ලක් වෙමින් තිබීම, යන කරුණු සලකා බලා මූලික විරෝධය ඉවතලීමට තීරණය කරන බවය. ඒ අනුව මෙම විමසීම දිගටම පවත්වා ගෙන යාමට තීරණය කරන ලදී.

දෙවන පාර්ශවය වෙනුවෙන් සාක්ෂියට කැඳවන ලද මූල්‍යකළමණාකරු සාක්ෂිය අවසන් කිරීමෙන් පසු එම පාර්ශවය වෙනුවෙන් තවත් සාක්ෂි නොකැඳවෙන අතර R1 සිට R7 දක්වා වූ ලේඛන ලකුණු කරමින් එම පාර්ශවයේ නඩුව අවසන් කරන ලදී. අනතුරුව දෙපාර්ශවයටම ලිඛිත සැලකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව දුනිමි.

ඉල්ලුම්කරු හා දෙවන පාර්ශවය අතර වූ මෙම කාර්මික ආරවුලට හේතුව ලෙස දක්වා ඇත්තේ ඉල්ලුම්කරු ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සේවයේ යෙදී සිටියදී 2008.07.15 වැනි දින සිට ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුරට පත් කිරීමේදී සහ 2010.08.21 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර තනතුරට පත් කිරීමේදී එම තනතුරුවලට අදාළ වැටුප් ගෙවීමේදී හා නියමිත ශ්‍රේණියන් හි පිහිටු වීමේදී ඉල්ලුම්කාරුට යම් අගතියක් සිදු වී ඇද්ද යන්නයි.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී A3 ලෙස සළකුණු කරන ලද ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුරට පත් කිරීම යටතේ ශ්‍රී ලංගම සභාපතිවරයා විසින් 2008.07.04 දාතමින් ඉල්ලුම්කරුට ලබා දී ඇති ලිපිය කෙරේ අවධානය යොමු කරමි.

එම ලිපියේ අංක 05 යටතේ සඳහන් කර අත්තේ

05. ශ්‍රී ලංගම සේවකයින්ගේ පඩි හා ශ්‍රේණි සංශෝධනය කරන තුරු 2008.07.14 වැනි දිනට ඔබට ගෙවූ පඩිය හා අනුමත දීමනාවක් 2008.07.15 වැනි දින සිට ගෙවනු ඇත.(A3a)

එම ලිපියේ අංක 06 යටතේ සඳහන් කර අත්තේ

06. ඉහත 5 ජේදයේ සඳහන් කළ පඩි සංශෝධනය නියමිත අධිකාරීන් මගින් අනුමත කිරීමෙන් පසුව ඔබගේ පඩි ක්‍රමය හා ශ්‍රේණිය ඔබට ලිඛිතව දැනුම් දෙනු ලැබේ.

ඉල්ලුම්කරුට ඉහත සඳහන් කර ඇති පත්වීම ලබා දී ඇත්තේ ඒ වන විටත් ඔහු ශ්‍රී ලංගම සේවකයකුව සිටිය දීය. එම ලිපිනයේ අඩංගු කරුණුවලින් පැහැදිලි වන්නේ නව පත්වීමට අදාළ පඩි හා ශ්‍රේණි පසුව ලබා දෙන බවකි.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී 2009.05.26 දාතමින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පාලන) මගින් ශ්‍රී ලංගම සභාපති වෙත යවන ලද ලිපියක පිටපතක් A 3 C ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. "තනතුරට අදාළ වැටුප් හා දීමනා නොගෙවීම" යනුවෙන් සඳහන් කර ඇති එම ලිපියේ ඉල්ලුම්කරු සඳහන් කර ඇත්තේ තමාට ලබා දී ඇති පත්වීම් ලිපි අනුව කටයුතු නොකරන ලද බවත් අදාළ වැටුප් හා දීමනා ලබා දීමට කටයුතු කරන ලෙසත්ය. එසේම එම ලිපියෙන් තවදුරටත් ඉල්ලා ඇත්තේ එසේ කරන තුරු තාවකාලික දීමනාවක් හෝ ලබාදීමට කටයුතු කරන ලෙසය. තවද ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී සඳහන් කරන ලද්දේ මෙම ආරවුල පිළිබඳව 2015 වසරේදී අංක 3534 යටතේ මහනුවර බේරුම්කරණයේදී විමසීම තිබුණ බවය. එහිදී දෙවන පාර්ශවය ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධයෙන් යම් එකඟතාවයක් පළ කළ බවය. ඊට අදළ ලේඛනයක් A ලෙස සලකුණු කර ඉදිරිපත් කරන ලදී. මෙම කාරණය සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කිරීම සඳහා A 3534 දරන නඩුවේ නඩු ගොනුවද පරීක්ෂා කරන ලදී. එහිදී දෙවන පාර්ශවය ප්‍රකාශ කර සිටියේ නඩු ගොනුවේ ඇති කාර්ය සටහන්වල බේරුම්කරුගේ අත්සන නොමැති වීම, රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන නොමැති වීම නිසා ඒ කිසිවෙකු මෙම නඩුවට අදාළ කරගත නොහැකි බවය.

එම කරුණ පිළිබඳව තවදුරටත් විමර්ශණය කිරීමේදී ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී A 14 ලෙස සළකුණු කරන ලද ශ්‍රී ලංගම ප්‍රධාන නීති නිලධාරී විසින් 2015.05.08 වැනි දින ප්‍රාදේශීය කළමණාකාර තැන ප්‍රාදේශීය කාර්යාලය, දූල්පිටිය, අටබාගේ වෙත යවන ලද ලිපිය කෙරේ අවධානය යොමු කළෙමි. එම ලිපියේ මෙසේ සඳහන් වේ.

බේරුම්කරණ නඩු අංක A 3534 ඉල්ලුම්කරු ඩබ්. එම්. ජයසිංහ මැය යටතේ යවා ඇති එම ලිපියේ මෙසේ සඳහන් වේ. 1 උක්ත දරන නඩුවේ ඉල්ලුම්කරු 2008.09.01 වැනි දිනැති ශ්‍රී ලංගම මුදල් කොට්ඨාස අංක මූ/ප/බී/70 අනුව 2008.07.15 වැනි දින සිට ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුර හා 2010.08.21 වැනි දින සිට 1 වන ශ්‍රේණියේ ප්‍රධාන කළමණාකාර තනතුරේ පිහිටුවා මා එකී තනතුරටත් අදළ ගෙවීම කිරීමට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය කළමණාකාරිත්වය විසින් එකගතාවය පළ කර ඇති බැවින් ඊට අදාළ ඉල්ලුම්කරුට ගෙවිය යුතු සම්පූර්ණ මුදල කොපමණ ද යන්න ගණනය කර වාර්තාවක් 2015.06.22 වැනි දින අධිකරණයට ඉදිරිපත් කරන ලෙස බේරුම්කරුතුමන් නියම කර ඇති බැවින් එකී ගණනයන් සිදුකර අදාළ ගෙවීම කොපමණද යන්න පිළිබඳ වාර්තාවක් නීති අංශය වෙත ලැබෙන්නට සලස්වන මෙන් දන්වමි. යනුවෙනි.

එම ලිපියෙන් තහවුරු වන්නේ අදාළ පත්වීම්වලට අදාළව ඉල්ලුම්කරුට වැටුප් හා දීමනා ගෙවීමට ඇති බව දෙවන පාර්ශවය පිළිගෙන ඇති බවයි. තවද එම ලිපිය සමග 2008.09.01 වැනි දිනැති මූ/ප/බී/70 දරන ලේඛනයේ පිටපතක් ද ඉදිරිපත් කරමි යනුවෙන් සඳහන් කර ඇත. දෙවන පාර්ශවය ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ අසන අවස්ථාවේදී එම පාර්ශවය වෙනුවෙන් කැඳවන ලද මූල්‍ය කළමණාකරුගේ සාක්ෂියේදී තහවුරු කිරීමට උත්සාහ කරන ලද්දේ අදාළ වන ලේඛන හා වැටුප් සංශෝධනය අනුව වැටුප් හා දීමනා ලබා ගැනීමට ඉල්ලුම්කරුට හිමිකමක් නොමැති බවයි. ඉල්ලුම්කරු විශ්‍රාම යන තුරුම අදාළ පත්වීම්වලට අදාළව ඔහුට හිමි විය යුතු වැටුප් හා දීමනා ගෙවා ඇති බවට දෙවන පාර්ශවය කිසිදු ලේඛනයක් ඉදිරිපත් කළේ නැත. ඉහත කරුණු සියල්ල සඳහා බලා ඉල්ලුම්කරුට දීමනා ගෙවීමේදී හා නියමිත ශ්‍රේණියන්හි පිහිටු වීමේදී අගතියක් සිදු වී ඇති බව තීරණය කරමි.

ඊලඟ කාරණය වන්නේ ඉල්ලුම්කරුට හිමිවිය යුතු සහන කවරේද යන්නයි. ඉල්ලුම්කරු ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුරට පත් කර ඇත්තේ 2008.07.15 වැනි දින දීය. 2010.10.04 වැනි දින දක්වා එම තනතුරේ කටයුතු කර ඇත. ඒ අනුව එම තනතුර මාස 21ක් පමණ කාලයක් දරා ඇත. එසේම ඉල්ලුම්කරු 2010.04.10 වැනි දින සිට ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකාර තනතුරට පත් කර ඇති අතර එම තනතුර 2010.10.10 දක්වා මාස 06ක් දරා ඇත. ඉල්ලුම්කරුට ලැබිය යුතු වැටුප් හා දීමනා පිළිබඳ ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී ලේඛනයක් A16 ලෙස සළකුණු කර ඉදිරිපත් කරන ලදී. එම ලේඛනය අනුව ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත්තේ 2008.07.16 සිට 2010 අගෝස්තු මාසය දක්වා ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුරට අදාළව රුපියල් පන් ලක්ෂ අනූ එක්දහස් තුන්සිය හැටයි ශත පනහ (රු. 591,360.50) ක මුදලක් ද 2010.08.21 වැනි දින සිට 2010.10.10 වැනි දින දක්වා ඔහු දරූ ප්‍රධාන ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුරට අදළව හිඟ මුදල වශයෙන් රුපියල් තිස් හය දහස් නවසිය අසූ හය ශත හතලිස් අට (රු. 36,986.48) මුදලක් ද වශයෙන් රුපියල් 630,446.98 ක මුදලක් ලැබිය යුතු බවයි. ඊට අමතරව ඉල්ලුම්කරු සඳහන් කර ඇත්තේ සේවක අර්ථසාධක අරමුදලේ කොටස් අහිමි වීම, සේවක භාරකාර අරමුදලේ කොටස් දායක මුදල අහිමි වීම ඇතුළු තවත් අගතීන් සිදු වී ඇති බවයි.

එම ලේඛනය සම්බන්ධයෙන් දෙවන පාර්ශවය වෙනුවෙන් ඉල්ලුම්කරු ගෙන් හරස් ප්‍රශ්ණ ඇසුවේ නැත. මේ හැරුන විට ඉල්ලුම්කරු සිය ලිඛිත දේශනය සමග X වශයෙන් ලකුණු කර තමාට සිදු වූ අලාභය පිළිබඳව ඊට වඩා වැඩි මුදලක් දෙවන පාර්ශවයෙන් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. X ලේඛනය මෙම කරුණ පිළිබඳ විමසීමේදී ඉදිරිපත් කරන ලද ලේඛනයන් නොවන නිසා එම ලේඛනය සැලකිල්ලට භාජනය නොකළෙමි. ඉහතින් සඳහන් කරන ලද A 16 ලේඛනයේ අඩංගු වන්නේ ඉල්ලුම්කරු විසින් ගණනය කරන ලද විස්තරයකි. එම නිසා එම ලේඛනයේ අඩංගු කර ඇති හිඟ වැටුප් හා දීමනා ඒ ආකාරයෙන්ම පිළිගත නොහැක. කෙසේ වුවද ඉල්ලුම්කරුට ලබා දෙන ලද පත් වීම්වලට අදළ වැටුප් හා දීමනා ලබා දීමට දෙවන පාර්ශවය පියවර ගෙන නොමැති බවටත් ඒ නිසා ඉල්ලුම්කරුට අගතියක් සිදු වී ඇති බව මා තීරණය කර ඇති නිසා ඉල්ලුම්කරුට සාධාරණයක් ඉටු කළ යුතුව ඇත. ඒ අනුව ඉල්ලුම්කරු 2008.07.06 වැනි දින සිට 2010.10.10 වැනි දක්වා ප්‍රාදේශීය ධාවන කළමණාකාර තනතුර දැරීම වෙනුවෙන් ද ඉහත තනතුරට අමතරව 2010.08.21 වැනි දින සිට 2010.10.10 දක්වා ප්‍රධාන ප්‍රාදේශීය ධාවන කළමණාකාර ධුරය දැරීම වෙනුවෙන් ද ඉල්ලුම්කරුට රුපියල් පන් ලක්ෂ පනස් දහය (රු. 550,000/-) ක මුදලක් ගෙවන ලෙසට දෙවන පාර්ශවයට නියම කරමි. එය ගැසට් ගත කිරීමෙන් තෙමසක කාලයක් තුළ නැගෙනහිර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බවද ප්‍රකාශ කරමි.

නීතිඥ සරත් ලියනගේ,
බේරුම්කරු.

2022 සැප්තැම්බර් මස 15 වැනි දින.

EOG 10-0154